# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදි.

නො. 7,481 — 1925ක්වූ අගෝස්තු මස 28වෙනි දිනවූ සිකුරාදා.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

---

### උපාඞගනීති.

**වර්ෂ 1917කේ අඞක 45 දරන වාරිමාර්ග පිළිබඳ ආඥාපණත.**

වර්ෂ 1917කේ අඞක 45 දරන වාරිමාර්ග පිළිබඳ ආඥාපණතේ 11වන වගන්තිය යටතේ දකුණු පළාතේ මාතර ගොවිතැනට ජලය සැපයීමේ දිස්ත්‍රික්කය තුළ ඉඩම් හිමියන් විසින් සාදනලදින් එකී ආඥාපණතේ 19වන වගන්තියේ ප්‍රකාර කාරක මන්ත්‍රී සභාගත ලංකාපාලනයෙහි නියුක්ත උතුමාණන්වහන්සේ විසින් අනුදන්නාලද ව්‍යවස්ථා.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්ෂ 1925ක්වූ ජූලි මස 24 වන දින කොළඹ මහලේකම්තැනගේ කන්තෝරුවේදීය. ——— ඒ. බී. ඇලෙක්සන්ඩර්, වැඩබලන මහලේකම් වමහ.

අලුත් නියොග.

1. වර්ෂ 1868වේ දෙසැම්බර් මස 11වෙනි දින අඞක 3,686 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1867 වීගොවිතැන් ආඥාපණත යටතේ පණවනලද 1868 දෙසැම්බර් මස 11වෙනි දින දරන ව්‍යවස්ථා මෙයින් අස්කරනු ලැබේ.

I.—ගොයිතැන් මූලාදූනින් හා ගම්මූලාදූනින් පත්කිරීම.

2. මේ නියොගවල පාලකතැන යන්නෙන් 1922කේ අඞක 22 දරන ආඥාපණතෙන් සකස්කරන ලද 1917කේ අඞක 45 දරන ගොවිතැනට ජලය සැපයීමේ ආඥාපණතේ 20 ($a$) වන වගන්තියේ ප්‍රකාර එකී ආඥාපණතෙන් උප දිසාපතිතුමා වෙත පවරා තිබෙන බල හා යුතුකම් පැවැත්වීම හා ඉෂ්ටකිරීම සඳහා ඔහුට ආධාරකිරීම පිණිස මූලාදූනියකු වශයෙන් ඔහු විසින් නිසිසේ පත්කරගත් පළාතේ මුදලිඳු හඟවයි. විදාන ආරච්චිවරුන් වෙල් විදානවරුන් තෝරාගැනීම.

ගොවිතැන් මූලාදූනියා යන්නෙන් ඉහතකී ප්‍රකාර උප දිසාපතිතුමා විසින් නිසිසේ පත්කරනලද කොටසයේ විදාන ආරච්චිල හෝ වෙනයම් කෙනකු හඟවයි.

ජලය සපයන මූලාදූනියා යන්නෙන් න්‍යායට ජලය සපයන මූලාදූනියා හැටියට කුඹුරුකාරයින් විසින් නිසිසේ තෝරාගනුලැබූ වෙල්විදානේ හෝ කිසිවකු එසේ තෝරානොගත් විටකදී එකී ආඥාපණතේ 21 (2) වන වගන්තිය යටතේ උප දිසාපතිතුමා විසින් වෙල්විදානේ හැටියට පත්කරනුලැබූ අය හෝ හඟවයි.

3 හරියාකාර බලාගැනීම හැකිවනු පිණිස එක් එක් මුදලිඳුගේ කොටසයට පාලකයෙක් පත්කරනු ලැබේ. වෙල්විදානේලාගේ ගණන උප දිසාපතිතුමා විසින් නියම්කරගත යුතුයි.

4. විදාන ආරච්චිවරුන් සහ වෙල්විදානේලා පාලකතැනගේ නියොග පදිරි තමතමන්ගේ ප්‍රදේශ සීමා තුළ සියලු ජලකර්මාන්ත සහ වීගොවිතැන විධානකිරීමද, මිනිසුන් රැස්කිරීමට හා කරන වැඩ බලාගැනීමට ආධාරෝපකාර කිරීමද මෙහි පහත සඳහන් නියොග යටතේ ලත් බල පැවැත්වීම හා ඒවා කඩකළ සියලු අවස්ථාවන්හිදී පාලකතැන මගින් ගම් නඩුසභාව ඉදිරියේ පැමිණිලිකිරීමද කළයුතුය.

5. (ඒ) වර්ෂා මාසවලදී එක් එක් ගමේ සියලුම වෙලි සහ දියබස්නා ඇළවල් වෙල්විදානේ විසින් සතියකට තුන්වරක්ද විදානආරච්චිල විසින් සතියකට වරක්ද පරීක්ෂා කළයුතුයි. ගංවතුර කාලවලදී මෙම පරීක්ෂණය දවස්පතා කළයුතුයි ; එකල සුළු අලුත්වැඩියාකිරීම් උවමනා බව දැනගන්ට ලැබුණිනම් ඒවා වුවමනා ස්ථානවල ඉඩම් හිමියන් ලවා කරවන්නට ඕනෑය. විස්තාර පරීක්ෂණය.

5. (බී) නමුත් යම් වෙල්ලකට හෝ දියබස්නා ඇළකට වහාම හරිගැස්වියයුතු කැඩුමක් බිඳුමක් සම්බන්ධ බරපතල අන්තරායක් පැමිණිවිට ගොවිතැන් මූලාදූනිතැන විසින් එම කාරණාව වහාම පාලකතැනට දන්විය යුතුය. ගොවිතැන් මූලාදූනිතැන හා ජලය සපයන මූලාදූනිතැන විසින් වහාම අණබෙර ලැවීමෙන් හෝ කටයුත්ත ඉතාම හොඳින් ඉෂ්ටවෙතැයි හැඟෙනසේ වෙන අනුමකින් ඒ කැඩීබිඳී ගිය වැඩෙන් ප්‍රයෝජන ලබන කුඹුරු අයිතිකාර සියල්ලන් රැස්කරවන්ට ඕනෑය. ඉඩම ගොවිතැන් කිරීම වුවමනාකරන සියලුදෙනාම කාරණාවට උවමනා අනුමට රෑ හෝ දවල් එම ස්ථානයට පැමිණ වහාම ඕනෑකරණ වැඩය සිදුකළ යුතුවේ.

5. (ඕ) ගොවිතැන් මූලාදෑනිතැන විසින් සිදුවූදේ විස්තරකොට රිපෝර්තයක් කච්චේරියට යැවීම පිණිස පූර්වන් ඉක්මනින් පාලකතැන වෙත යැවිය යුතුවේ.

## II.—හුවන්දිරම්.

*බෙදන ක්‍රමය.*

6. ගොවිතැන්කරන සියලුම ඉඩම් ඊට ලැබෙන අස්වැන්නෙන් 1/48 පංගුවක් හුවන්දිරම් වශයෙන් ගෙවීමට යටත්ය. එය මෙහි පහත සඳහන් අනුමට බෙදනු ලැබේ:—කුඩා වැඩ සෑදීමට හා පවත්වා ගැනීමටද වැඩකරන මූලාදෑනීන්ගේ පඩි ගෙවීමට හා අනියම් වියදම් සඳහාද $\frac{1}{6}$ පංගුවක් හා ගොවිතැන් මූලාදෑනීන්ට $\frac{1}{3}$ පංගුවක්ද, 1917තේ අංක 45 දරන ගොවිතැනට ජලය සැපයීමේ ආඥාපණත යටතේ තෝරාගනු ලැබූ හෝ පත්කරනුලැබූ වෙල්විදානවරුන්ට $\frac{1}{2}$ පංගුවක්ද වේත්.

7. ජලය සපයන මූලාදෑනියකුවෙනුවට කටයුතුකිරීමට පත්කරනලද යම් අයකුට ඔහු එසේ වැඩකළ කාලයේ හැටියට හුවන්දිරම්වලින් කොටසක් ලැබිය යුතුයි.

*රාජකාරි අතපසු කිරීම ගැන දඬුවම.*

8. තම යුතුකම් හරියාකාර ඉෂ්ටකිරීමේ හෝ තම පළාතේ ජලය සැපයීමේ ඇළවල් ආදිය නඩත්තු කිරීමට ඉඩහැරීමේ වරද නිසා යම් මූලාදෑනියකුට ලැබියයුතු හුවන්දිරම් කොටස නොදෙන්නට උපදිසාපතිතුමාට බලය තිබේ.

*හුවන්දිරම් දඩමෙන් ගැනීම.*

9. එසේ නොදෙනලද හුවන්දිරම් සියල්ලම මෙම ආඥාපණත යටතේ අයකරගත් දඩමෙන් සලකනු ලැබේ.

*බෙදුදීම.*

10. හුවන්දිරම්වශයෙන් දෙන අස්වැන්නෙන් 1/48 පංගුව එකතුකරගැනීමේ අසිතිවාසිකම බදු දීමට නියමකරන්නට, දිස්ත්‍රික්කේ අනුශාසක සභාවේ කැමැත්ත හා අනුශාසනාව ඇතුව උපදිසාපතිතුමාට නීතියනුව කළහැක.

## III.—සාමාන්‍ය වැඩ.

*දියබස්නා මාර්ග නොහොත් ඇළවල්*

11. සියලු කුඹුරු අසිතිකාරයින් විසින් තම තමන්ගේ කුඹුරුවලට යාබදවූ ඇළවල් ශුද්ධකොට අලුත්වැඩියාකොට යහපත් අන්දමින් පවත්වා ගතයුතුයි. තවද ඔවුන් තමතමන්ට අසිති බිම් ප්‍රමාණයේ හැටියට පොදුවේ වැඩකිරීමෙන් ඇළවල් දිගටම සම්පූර්ණයෙන් අලුත්වැඩියාකළ යුතුයි.

*වේලි හා වැව්.*

12. මෙම කොටසයේ අතුරු කොටස එකකට වැඩි ගණනකට වතුර සැපයීම සඳහා සාදා තිබෙන, ඇළවල් සහ කුඹුරු යායවල් හරස්කොට බඳිනලද අමුණු නොහොත් වේලි ඉන් ප්‍රයෝජනය ලබන සියලුම කොටසවල ඉඩම් හිමියන් හා ගොවීන් එකතුව වැඩකිරීමෙන් බැඳ සුරක්ෂිතව තබාගත යුතුයි. තවද යම් එක් අතුරු කොටසයකට පමණක් ප්‍රයෝජනවන වේලි ඒ අතුරු කොටසයේ ඉඩම් අසිතිකාරයින් සහ ගොවීන් විසින් එකතුව වැඩකිරීමෙන් බැඳිය යුතුයි. මේ වැඩ ගොවිතැන් මූලාදෑනිතැන නියමකළවිට කළයුතුවේ.

*අලුත් වේලි බැඳීම හෝ ඇළවල් කැපීම.*

13. කුඹුරුයායේ ගොවින් වැඩිදෙනාගේ ඉල්ලීමපිට ගොවිතැනට වතුරදීමට සහ වතුර රැස්කර තැබීමට උවමනායයි පාලකතැන කල්පනාකරන යම් යම් අලුත් ඇළවල් දියපාරවල් හා වැව් කැප්ප වීමටද අලුත්වේලි බැන්දවීමටද ගොවිතැන් මූලාදෑනීන්ට නියමකිරීමට පාලකතැනට බලය තිබේ. තවද යායේ සියලු ගොවීන් විසින් තමතමන්ට වැටෙන වැඩකොටස් පාලකතැන නියමකරන කාලය තුළ කළයුතුයි.

*ඉඩම් ඇතුල්කර ගැනීම සහ අවහිර කිරීම.*

14. මොනම කාරණවක් නිසාවත් කිසිවකු විසින් දියමගකට, ඇළකට හෝ වැවකට අසිති බිම් අල්ලාගැනීම හෝ එබන්දක් පළලින් අඩුකිරීම නොකළ යුතුයි. තවද උප දිසාපතිතුමාගේ කැමැත්ත නැතුව කිසිවකු විසින් කිසිම ස්ථිර කර්මාන්තයක් යම් දියබස්නා මාර්ගයක හෝ ඇළක නොකළ යුතුයි. කරන්නට තිබෙන වැඩේ ආකාරය ගැන උප දිසාපති තුමාගේ කැමැත්ත ලබාගත යුතුය.

*වේලිවල වක්කඩවල් නොකැපිය යුතුය.*

15 ස්ථිර වේල්ලක වක්කඩවල් කැපීමට ඉඩදෙනු නොලැබේ. නමුත් ජලය සපයන මූලාදෑනියා විසින් උවමනා සියලු තත්හි නල තැබිය යුතුයි. නල තැබීමේ සහ ඒවා පවත්වාගැනීමේ වියදම එකී දියපාරෙන් ජලය ලබන සියලු ඉඩම් අසිතිකාරයින් විසින් තමතමන්ගේ බිම්ප්‍රමාණයට හැමදෙනා එක්වම දැරිය යුතුවේ.

*ජලය හරවා යැවීම.*

16. පුරාණ වේල්ලකින් නොහොත් අමුණකින් හරවා ජලය හැරීම පිණිස පුරාණ අමුණේ ජලයෙන් ප්‍රයෝජන ලබන සියල්ලන්ගේම කැමැත්ත නොමැතිව අලුත් අමුණක් නොහොත් වේල්ලක් නොබැඳිය යුතුය. තවද 18වෙනි 19වෙනි නියෝගවල ප්‍රකාරමිස, වෙන අන්දමකින් පහළින් තිබෙන අමුණක වතුර නැතිකම හෝ හිඟකම පිරිමසා ගැනීම පිණිස ඉහළින් තිබෙන අමුණක් කිසිවකු විසින් බිඳහෙලිය යුතුනොවේ.

## IV.—ගොවිතැනට ජලය සැපයීමේ සහ එය බෙදීමේ විස්තර.

*ගොවිතැන් වැඩ පටන්ගන්නා කාලය*

17. (*a*) වැඩ පටන්ගැනීමට සහ වැපිරීමට කාලය නියමකර ගැනීමද වැපිරීමට වී වර්ග තෝරාගැනීමද ඒ මෝසමට උවමනා අනිකුදු සියලු කටයුතු නිශ්චයකරගැනීමද සඳහා එක් එක් මෝසමට වැඩ පටන් ගැනීමට අඩුගණනේ සතිදෙකකට මත්තෙන් පාලකතැන විසින් තමන්ගේ පළාතේ ස්ථාන එකක හෝ වැඩි ගණනක රැස්වීම් පැවැත්විය යුතුයි. සියලුම කාරණ ගොවීන් වැඩිදෙනාගේ අදහසලෙස තීරණය කරගත යුතුවා පමණක් නොව අඩුපක්ෂය ඒ තීරණයට යටහත්දනවේ. පාලකතැන එබඳු සෑම රැස්වීම්වල සිදුවූ කරුණුවල වාර්තා සම්පාදනයකළ යුතුවා පමණක් නොව ඒවායේ සටහනක් ලියා හෝ ලියවා තබා එබඳු රැස්වීම අවසානයේදී අත්සන්කළ යුතුයි.

(*b*) ඉඩම්කාරයින්ට කලින් නිසිආකාර දැනුම්දුන්පසු සෑහෙනකරුණක් නැතුව ඉඩම්කාරයින්ගෙන් සෑහෙන ගණනක් එබඳු රැස්වීමට හෝ රැස්වීම්වලට නොපැමිණියොත් ගොවිතැන් මූලාදෑනින්ගේ හා ජලය සපයන මූලාදෑනින්ගේත් කැමැත්ත ඇතුව වැඩ පටන්ගැනීමට හා වැපිරීමට දින නියමකරන්නටද, වැපිරීමට වී වර්ග තෝරාගන්නටද ඒ මෝසම සම්බන්ධ සියලුම කටයුතු තීරණය කරගන්නටද පාලකතැනට බලය තිබේ. එබඳු සියලුම තීරණයන් සිදුවූ කරුණු සටහනේ ලකුණුකොට පාලකතැන විසින් අත්සන්කළ යුතුයි. ඒ තීරණයන්ට සියලුම ඉඩම්කාරයෝ තම තමා එම රැස්වීමට හෝ රැස්වීම්වලට පැමිණ සිටියාක්මෙන් යටහත්වෙත්.

*දියබෙදීම.*

18. ඒ ඒ කොටසවල ඉඩම්වලට දිය බෙදාදීම ගොවිතැන් මූලාදෑනියා හෝ ජලය සපයන මූලාදෑනියා විසින් නියමකළ යුතුය. කවර කාරණයක් සඳහාවත් ගොවිතැන් මූලාදෑනියාගේ හෝ ජලය සපයන මූලාදෑනියාගේ කැමැත්ත නැතුව ඇළක් හෝ දිය බස්නා මාර්ගයක් ගොවියකු හෝ ඉඩම් අසිතිකාරයකු විසින් අවහිරකිරීමවත් සොරොව්වක් හෝ වේල්ලක් ඇරීමවත් නොකළ යුතුයි. එවැනි යම් අවහිරයක් කළවිට සාක්ෂිකාරයින් ඉදිරිපිටදී ගොවිතැන් මූලාදෑනියාම එය අහක්කළ යුතුයි.

*දිය සෑහෙන පමණ නැතිවිට බෙදීම.*

19. නියඟ නිසා හෝ යම්කිසි වේල්ලකට අදිසි අනතුරක්වීමෙන් හෝ ඒ මෝසමට වුවමනා පමණ ජලය නොතිබුණිනම් එක් එක් අතුරු කොටසයට දියයුතු සම්පූර්ණ ජල ප්‍රමාණය කාලසීමාවක් ඇතුළත ගොවිතැන් මූලාදෑනිතැනගේ කැමැත්ත ඇතුව පාලකතැන විසින් බෙදාදිය යුතුයි. මෙසේ කරනලද තීරණය අන්තිම තීරණයවේ.

*වැව්වල වතුර හිඟවූ විට ගොවිතැන්කරන බිම් ප්‍රමාණය.*

20. යම් වැවක තිබෙන වතුර ඒ වැවෙන් වැඩවෙන මුළු කුඹුරුයාය අස්වැද්දීමට මදියයි හැඟේනම් පාලකතැන එය පරීක්ෂාකොට ගොවිතැන් මූලාදෑනියාගේ හා වතුර සපයන මූලාදෑනියාගේත් කැමැත්ත ඇතුව ඒ මෝසමට ඒ යායෙන් කොපමණ හරියකට ඒ වැවෙන් වතුර දියයුතුද්දැයි නිශ්චය කරගත යුතුය.

*දියබැසයන අතර නැවැත්වීම.*

21. යම් කෙනකු විසින් තමාගේ කුඹුරට පහළින් පිහිටි කුඹුරට දිය බැසයාම ඕනෑකමින්ම වැළැක්කුවහොත් ජලය සපයන මූලාදෑනිතැන සාක්ෂිකාරයින් සමග එම ස්ථානයට ගොස් තමාම වක්කඩ වල් කැපිය යුතුවේ.

*සීසෑම.*

22. එක් එක් ගොවියාට සීසෑම පිණිස දෙනලද කාලය ඔහුගේ ඉඩමේ තරමට ගණන්බලා වේ. ගොවියකු විසින් නිසි කලට සීසෑම් නොකොට අතපසුකලොත් දිය ලැබීමේ වාරය ඔහුට නැතිවේ. සීසෑම් අගවතින් පටන්ගෙන මුල්වත කුඹුරුවලින් නිමවිය යුතුය.

*පිළිවෙළ.*

23. (a) යම් යායක කුඹුරු වැපිරීමට සූදානම්කළ කල්හී පළමුකොට ඉතා උස්බිමේ කුඹුරුවලට වතුර දියයුතුයි. ඉතා පහත් බිම දක්වා අනිකුත් කුඹුරුවලට ක්‍රමයෙන් වතුර ගතයුතුයි. යම් ඉඩම්කාරයකු ඔහුගේ කුඹුර නියමකාලයේදී සැලකියයුතු කරුණක් නොමැතිව නොවපුලොත් ඔහුගේ ජලය ලැබීමේ වාරය නැතිවේ. එමෙන්ම ගොයමට වතුර දීමට එක් එක්කෙනාගේ වාරය පැමුණුණම ඒ පිළිවෙළටම කුඹුරුවලට වතුර දියයුතුයි. එක් එක් කුඹුරුකාරයාට දියයුතු වතුර ප්‍රමාණය ජලය සපයන මූලාදෑනීන් විසින් නියම අනුමට බෙදා දියයුතුයි.

23. (b) යම් ඉඩම්කාරයකු තමාගේ කුඹුර නොසලකිල්ලෙන් වැඩකිරීමනිසා හෝ ඊෂ්‍යාවෙන් තම කුඹුරට පහළින් පිහිටි කුඹුරුවලට වතුර ගලාබැසීම නැවැත්තුවහොත් ගොවිතැන් මූලාදෑනියා හා ජලය සපයන මූලාදෑනියා සාක්ෂිකාරයින් සමග වහාම එම ස්ථානයට ගොස් යම් අවහිරයක් තිබේනම් එය ඉවත්කොට තමාම වක්කඩවල් කැපිය යුතුයි.

*ගොවිතැන් නොකර හැරීම හෝ අතපසු කිරීම.*

24. යායක කුඹුරු අතුරෙන් වැඩි ගණනක් ගොවිතැන්කිරීමට සූදානම්කරගෙනයද්දී 17වෙනි නියෝගයේ ප්‍රකාර දැනුම්දුන්නායින් පසු යම් කුඹුරක් වැඩකිරීම පැහැරහැරියොත්, අතපසුකලොත් හෝ නුවමනාසේ ප්‍රමාදකලොත් එම කුඹුර වැඩකිරීමට සුදුස්සෙක් තෝරා බාරදීමට පාලකතැනට බලය තිබේ. තවද එම අය ඒ කුඹුර ගොවිතැන්කොට අයිතිකාරයාට බිම්කොටස දියයුතුයි.

25. යම් කුඹුරුකාරයකු ඔහුගේ කුඹුර හෝ ඉන් යම් කොටසක් ගොවිතැන් කරන්නට බැරිය කීවොත් හෝ පැහැර හැරියොත් පාලකතැන විසින් එය වැඩකිරීමට වෙන ගොවියකුට හෝ කුඹුරුකාරයකුට බාරදෙනහැක. ගොවිතැන පාලුවුණත් බිම්කොටස ගෙවීමට යටහත්නොවේ. එබඳු අය ඒ කුඹුර හෝ කුඹුරු කොටස වෙනුවෙන් මේ නියෝග යටතේ කළයුතු සියලුදේම කිරීමට යටහත්වේ.

*බැසයන වතුර.*

26. වෙල්යායක් මැදින් පුරාණ ඇළවලින් වතුර ඉන් පහළ යායක් අස්වැද්දීම පිණිස ගෙනයන විට එසේ පසුකරගෙන යන කුඹුරුවලට එබඳු වතුරපාරෙන් වතුර හැරවීම හෝ එය හරස්කිරීම හෝ ඊට වෙන අන්දමකින් අනතුරුකිරීම හෝ කිසිවකු විසින් නොකළ යුතුයි.

## V.—වැව්.

*වැකඳු නොකපනු.*

27. පළාතේ පාලකතැනගේ අවසරය නොමැතිව කොයිම කාරණයක් සඳහාවත් කිසිවකු විසින් වැකන්දක් කපාදැමීම නොහොත් පහත්කිරීම යුතුනොවේ. දියදෙරක් හෙවත් සොරොව්වක් ඇතිතැන දිස්ත්‍රික්කයේ උප දිසාපතිතුමාගෙන් විශේෂ අවසරයක් නොමැතිව එසේ කළයුතු නොවේ.

*වැව් බිමේ ගොවිතැන්කිරීම.*

28 උප දිසාපතිතුමාගෙන් අවසර නොමැතිව වැව්බිම හෝ වැකන්දේ ගොවිතැන් නොකළ යුතුයි.

*අලුත් ඉඩම් අස්වැද්දීම.*

29. අලුත් ඉඩම් අස්වැද්දීමට එහි අනිකුත් කුඹුරු අයිතිකාරයින්ගේ කැමැත්ත නොමැතිව වතුර හැරවීම කිසිවකු විසින් කළයුතු නොවේ. යම් අයිතිකාරයෙක් සෑහෙන කරුණු නොමැතිව ඊට ඉඩදෙන්නට බැරිය කීවේනම් ඒ ගැන පාලකතැනට කියාසිටිය හැක. ඔහුගේ තීන්දුව අන්තිමය වේ.

## VI.—සාමාන්‍ය වැඩ.

*සූදානම.*

30. සියලු කුඹුරු අයිතිකාරයින් හෝ ගොවීන් විසින් එකවිට නියරවල් බැඳ පහළ කුඹුරුවලට ජලය යාම පිණිස නිසි වක්කඩවල්ද තැබිය යුතුයි.

*වෙනස්කිරීම.*

31. එකම යායක කුඹුරු අතරේ මායිම් හෙවත් ඉම්නියරවල් කිසිවකු විසින් කිසි අනුමකින් වෙනස්කිරීම හෝ කඩාබිඳ දැමීම නොකළ යුතුයි. එබඳු යමක් කළබව දැනගත්විට ගොවිතැන් මූලාදෑනිතැන සාක්ෂිකාරයිනුත් සමග එතැනට හැකිපමණ ඉක්මනින් ගොස් ඒ සියලු වෙනස්කිරීම් ප්‍රථමයෙන් තිබුණ අනුමට හරිගස්සවිය යුතුයි.

*පවත්වාගැනීම.*

32. ඉම්නියර එහි දෙපැත්තේ කුඹුරුකාරයින් විසින් පොදුවේ ගොඩනගා පවත්වා ගතයුතුයි.

*වල්පැළෑටි.*

33. නියරවල් යාබද ඉඩම් අයිතිකාරයින් විසින් ඒවා වල්පැළෑටි ආදියෙන් තොරව තබාගත යුතුයි.

*දෝෂ හරිගැස්සීම*

34. ඉම්නියරවල් පිළිවෙළකට නැතිකමින් ගොවිතැන්කිරීමට බාධා පැමිණි යම්කිසිවිටකදී ඉඩම් හිමියන්ගේ අයිතිකම්වලට හානි නොවෙනසේ කළහැකිනම් එබඳු බාධා හරිගැස්සීම නියමකරන්නට පාලකතැනට නීතියේ ප්‍රකාර බලය තිබේ.

35. ගොයම් කැපූවාට පසු පළමුවෙනි වර්ෂාවේ පටන් නැවත ගොවිතැන්කරන කාලය පැමිණෙනතුරු ගොවීන් විසින් සියලු වේලි සහ නියරවල් අලුත්වැඩියාකොට වක්කඩවල් අහුරා ඒ සියල්ල හොඳින් පවත්වා ගතයුතුවේ. මේ කටයුතු කරවීම ගොවිතැන් මූලාදෑනීන්ගේ යුතුකමවේ.

## VII.—වැටවල්, මුරපැල් සහ ගොයම්කැපීම.

*වැටවල් බැඳීම.*

36. මුළු වෙල්යායක් වටේ වැටක් උවමනායයි ගොවිතැන් මූලාදෑනිතැන කල්පනා කරනම් ඔහු එබඳු වැටේ දිග මැන එක් එක් කුඹුරුකාරයාට, වැට ඔහුගේ කුඹුරට යාව තිබුණත් නොතිබුණත්, ඔහුගේ කුඹුරේ ප්‍රමාණයට වැට බෙදාදිය යුතුයි.

*මුරපැල.*

37. අස්වැන්න ආරක්ෂාකිරීම සඳහා මුරපැල් කුඹුරුකාරයින් විසින් තනා ගොවිතැන් මූලාදෑනිතැන විසින් නියමකරන පරිදි හොඳින් පවත්වාගෙන වාර පිළිවෙළට මුරකළයුතුය.

*අත්මග.*

38. කුඹුර අයින වටේ බඹ පහක් පළලට අත්මග එළිකළ යුතුයි. එහෙත් එසේ කෙරීමේදී ලොකු හෝ වටිනා දැවගස්වලට හෝ පලතුරු ගස්වලට අනතුරු නොකළ යුතුයි. ඉඩම් අයිතිකාරයින් විසින් කුඹුරුවලට නැමීතිබෙන ගස්වල අතු සියල්ල කපා අහක්කළ යුතුයි. එසේ කරන්නට නිසිසේ දැනුම්දුන් පසු නොකළොත් පාලකතැනගේ කැමැත්ත ඇතුව ගොවිතැන් මූලාදෑනිතැන විසින් අයිතිකාරයාගේ වියදමින් එය කළයුතුයි.

ගොයම්කැපීම.

39. යම කුඹුරු යායක කොටසක් ඉතිරි හරියට කලින් පැසුණොත් එම කොටසේ ගොවියාට ගොවිතැන් මුලාදෑනිතැනගේ කැමැත්ත ඇතුව එය කපා රැස්කරගන්නට ඉඩදිය යුතුයි. නමුත් සම්පූර්ණ යායේ ගොයම් කපා රැස්කරගත් බව ගොවිතැන් මුලාදෑනිතැන විසින් ප්‍රකාශකරනතුරු යායේ ආරක්ෂාව පිණිස සිරිත් ප්‍රකාර ඔහු විසින් කළයුතු ආධාර කඩනොකළ යුතුයි.

VIII.—මංමාවත්.

හරස් මාර්ග.

40. කුඹුරු යායක් හරහා ප්‍රධාන අඹිපාරක් ඇතිකල ඊට යටත්පිරිසෙසින් අඩි තුනක් පළල නියරක් හැරිය යුතුයි. එහෙත් පාලකතැනගේ කැමැත්ත ඇතුව ඒ වෙනුවට සුදුසු පිටපාරක් කැමති නම් තබන්නට ඉඩම් හිමියන්ට ඉඩතිබේ. උප දිසාපතිතුමාගේ අවසරය නැතුව ගම්සභාපාරක් හරස්කොට වැටක් නොබැඳිය යුතුයි.

41. යම්කිසි ප්‍රධාන අඹිපාරක් හරහා දියපාරවල් ඇතිවිට එයින් ජලය ලබන කුඹුරුකාරයින් විසින් හරියාකාර කුඹුසු හැඹිය යුතුයි.

IX.—ගවයෝ.

වපුල යායෙන් පිටකිරීම.

42. වැඩෙන ගොයම් ඇති යම් කුඹුරක හෝ ඊට ආසන්නව එක්කෝ ගොයම් තිබෙන කුඹුරු යායක ගොවිතැන් නොකොට හෝ නොවපුරා හරිනලද කුඹුරක හෝ බිම්කැබැල්ලක කිසිවකු විසින් ගවයින් දිගේලිකිරීම හෝ කැවීම නොකළ යුතුයි.

ගවයින් දිගේලිකිරීම හා දූක්කිම.

43. ගොවිතැන්කළ කුඹුරුවලට වැට බදින සිරිතක්නැති ගම්වල ගවයින් ඇති අය විසින් තම ගවයින් ගොයම් කුඹුරුවලට බොහෝ ඈතින් දිගේලිකළයුතුයි. නැතහොත් ගොවිතැන් මුලාදෑනිතැන විසින් අණබෙරලවා දැනුම්දුන් වහාම ගවයින් ගමින් පිටකළ යුතුයි. තවද ගොවිතැන් මුලාදෑනියා විසින් නැවත අවසර දෙනතුරු ගවයින් ලිහාහැරීම හෝ ආපසු ගමට ගෙනඒම නොකළ යුතුයි.

44. යම් යායක පිහිටි සියලුම කුඹුරුවල ගොයම්කපා අස්වැන්න අස්කරගන්නාතුරු එහි පිහිටි කුඹුරක අයිතිකාරයකු විසින් ඔහුගේ කුඹුරට ගවයින් දූක්කිම එහි තණ කැවීම හෝ දිගේලිකිරීම නොකළ යුතුයි.

X.—නොයෙක් කරුණු පිළිබඳ ව්‍යවස්ථා.

කුඹුරු අයිතිකාරයින් විසින් ඔවුන්ගේ ගොවීන්ගේ නම් ලියාදීම.

45 පළාතෙන්පිට පදිංචි කුඹුරු අයිතිකාරයින් විසින් ඔවුන්ගේ කුඹුරුවල එක් එක් මෝසමේ වැඩ පටන් ගැනීමට සතියකට ප්‍රථමයෙන් ඔවුන්ගේ කුඹුරුවැඩකරනු ගොවියන්ගේ නම් ගොවිතැන් මුලාදෑනිතැනට ලියාදිය යුතුයි.

46. යම් කුඹුරුකාරයකුට හෝ වෙනයම් අයකුට තමන්ගේම ප්‍රයෝජනය සඳහා අනිකුත් කුඹුරුකාරයින්ගේ ප්‍රයොජනයට හානිවෙන පිළිවෙළට කටයුතු කරන්නට අවසර නැත.

47. මේ නියොග හෝ ඉන් යමක් යටතේ ඉඩම් හිමියන් විසින් ඉෂ්ටකළයුතු කටයුත්තක් ඇති කල්හි එක් එක් කුඹුරුකාරයා විසින් එය කළයුත්තේ තමතමාට අයිති බිම්ප්‍රමාණයේ අන්දමටය.

48. අදිසි ජලගැල්මෙන් වැව්වලට සිදුවන අනතුරු වැළැක්වීම පිණිස හා පළාතේ පදිංචිනැති කුඹුරු අයිතිකාරයින්ට කළනොහැකි කඨිනම්න් කටයුතු වැඩ කිරීම පිණිසත්ඊඔවුන් විසින් සිරිත්ප්‍රකාර වැඩකරවීමට පිළිවෙළ සැලැස්විය යුතුයි.

අයිතිකාරයා වෙනුවට ක්‍රියාකරන්නා.

49. ඉඩමක් අයිතිකාරයකුගෙන් සිරිත්ප්‍රකාර කෙරෙන්නට තිබෙන සියලු යුතුකම් ඉෂ්ටකිරීමට ඒ ඉඩම වැඩකරන අය යටහත්වේ.

50. කුඹුරුවලට වතුරදීම හා ගොයිතැන්කිරීම පිළිබඳවූ, ඉඩම්වල අයිතිවාසිකමගැන සම්බන්ධයක් නැති, සියලු කරුණු පාලකතැන විසින් විසඳනු ලැබේ. පාලකතැනට බේරුමක් කරන්නට නොහැකිවූවිට දෙපාර්ශ්වය ගම්නඩුසභාවට යැවිය යුතුයි.

51. ගොයම් කැපුවායින් පසු සෑහෙන කාරණාවක් නොමැතිව විසිදවසකට වැඩිකාලයක් පාවෙරේ වී තබන්නට ඉඩදෙනු නොලැබේ. ඒ කාලය ගතවන්නට මත්තෙන් එක් එක් ගමේ ගොයම් පාගා අස්වැන්නෙන් යම් කොටසක් හෝ කොටස් ලැබිය යුත්තන් අතරේ එය බෙදාදිය යුතුයි.

52. ඉහත සඳහන් නියෝග ප්‍රකාර කටයුතුදේ පැහැර හරින හෝ ඒවා කඩකිරීම සම්බන්ධවූ යම් ක්‍රියාවක් කරන අය 1917තේ අංක 45 දරන ගොවිතැනට ජලය සැපයීමේ ආඥාපනතේ පස්වෙනි පරිච්ඡේදයේ ප්‍රකාර දඬුවම්වලට යටහත්වේ.

53. වී ගොවිතැන ගැන සහ ආණ්ඩුව විසින් අයගැනීම ගැනද මේ නියොගවල විශෙෂ වශයෙන් සඳහන්නුවූ දැනට පවත්නා යම්කිසි සිරිතක් ඇද්ද ඊටද මෙම නියොගවල බලය ඇතිවනු පමණක් නොව එය මෙම නියොගවලම කොටසක් හැටියට සලකනුද ලැබේ.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**No. 2,820, C. P.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ඔක්තෝබර් මස 14වෙනි දිනවූ බදාදා පස්වරු 1·30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුනන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ පාතදුම්බර කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

මුල් සිතියම 7,624. ගම—පාතදුම්බර පල්ලේගම්පහ කෝරලේ යටවර.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 3 | බඹරගහමූලහේන .. | — .. | ආණ්ඩුව .. | හේන .. | 1 1 5 | 400* |

* නැවත ප්‍රසිද්ධකරණලදී.

මෙම ඉඩම ගැණ වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒසේ සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 22වෙනි දින කොළඹ
මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ජේ. බී. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහලේකම් වෙනුවට.

**No. 2,821, C. P.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1925ක්වූ ඔක්තෝබර් මස 12වෙනි දිනවූ සඳුද පස්වරු 1·30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ හාරිස්පත්තු කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

මුල් සිතියම 6,756. ගම—හාරිස්පත්තුවේ ගලසියපත්තුවේ හිඟුල්වල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 1C | ගල්පොත්තේ හේන | — .. | කුලතුන් මුදියාන්සේලාගේ කළුබන්ඩා, කුලතුන්මුදියාන්සේලාගේ පුංචිරාල, ගණේනායක මුදියාන්සේලාගේ කිරිබන්ඩා, පුස්සේ ගොඩගෙදර උක්කුබංඩා, පුස්සේගොඩගෙදර කළුබන්ඩා, පුස්සේගොඩගෙදර කිරිබංඩා, පුස්සේ ගොඩගෙදර අප්පුහාමි සහ පුස්සේ ගොඩගෙදර රංමැනිකා | හේන .. | 3 0 29 | 50* |
| 1D | දඹහේන .. | — .. | පුස්සේගොඩගෙදර උක්කුබන්ඩා .. | එම .. | 1 3 7 | 50* |
| 1E | එම .. | — .. | අතපත්තුමුදියාන්සේලාගේ අප්පුහාමි .. | එම .. | 0 1 19 | 50* |

* නැවත ප්‍රසිඩකරණලදී.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1925ක්වූ අගෝස්තු මස 20වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඊ. බී. ඇලෙක්සැන්ඩර්,
වැඩබලන මහලේකම් වම්හ.

---

**No. 2,822, C. P.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1925ක්වූ ඔක්තෝබර් මස 19වෙනි දිනවූ සඳුද පස්වරු 1·30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩදුම්බර කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

මුල් සිතියම 7,379. ගම—උඩදුම්බර ගන්දෙකේ කෝරලේ ඉලුක්හේන.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 1 | කුඹුක්බෙර .. | — .. | ආණ්ඩුව .. | මූකලාන .. | 0 3 18 | 30* |
| 3 | එම. .. | — .. | එම .. | එම .. | 1 2 15 | 30* |

* නැවත ප්‍රසිඩකරණලදී.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1925ක්වූ අගෝස්තු මස 24වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඊ. බී. ඇලෙක්සැන්ඩර්,
වැඩබලන මහලේකම් වම්හ.

---

මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම්වල බද්ද ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1925ක්වූ ඔක්තෝබර් මස 20වෙනි දිනවූ අඟහරුවාදා දවල් 2ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩපලාත කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 22ක්.

දුම්රිය දෙපාර්තමේන්තුවේ සිතියමේ නො. 07,065. ගම—හැ. 80 සහ හැ. 80 ද. 28½ අතරේ. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක අවුරුද්දකට තක්සේරු බද්ද මුදල, රු. |
|---|---|---|---|---|---|
| — | දුම්රියට ඉතුරු කරතිබේ | ගම්පොල හලාගම පදිංචි බී. බී. ඇස්. අල්විස් සහ ඇම්. ඇස්. නාගලින්ගම් | තේ සහ තණකොළවැවීම | 3 0 21·5 | 30 |
| | දුම්රිය දෙපාර්තමේන්තුවේ සිතියමේ නො. 06,909. ගම—ගම්පොලටත් උලපනේටත් අතර තිබෙන හැ. 81 ද. 15½ සහ හැ. 81 ද. 20½ අතරේ. | | | | |
| — | දුම්රියට ඉතුරු කරතිබේ | උලපනේ තැඹිලිගල මැද්දුමාගෙදර කේ. ඇම්. පොඩිසිංඤෝ | එලවළුවැවීමට සහ ඉඩමේ තිබෙන ගස්වල එලප්‍රයෝජනය ලබාගැනීමට | 0 2 0 | 7·50 |
| | දුම්රිය දෙපාර්තමේන්තුවේ සිතියමේ නො. 07,027. ගම—හැ. 77 ද. 22 සහ හැ. 77 ද. 47·70 අතරේ. | | | | |
| — | දුම්රියට ඉතුරු කරතිබේ | ගම්පොල කහටපිටියේ පල්ලියේ ඒ. ඇම්. ලෙබ්බේ සහ ගම්පොල ඉලවතුරේ සූරියදාස | ගොඩ ගොයිතැනට .. | 2 1 9 | 30 |
| | දුම්රිය දෙපාර්තමේන්තුවේ සිතියමේ නො. 06,910. ගම—හැ. 77 ද. 25 සහ හැ. 76 ද. 44½ අතරේ. | | | | |
| — | දුම්රියට ඉතුරු කරතිබේ | ගම්පොල කිරින්දේ සෙනෝලේ ගුරුන්නාන්සේ බාරේ, උඩඹිට ගුරන්මුදියන්සේලාගේ කිරිබන්ඩා | එලවලු වැවීමට .. | 4 0 0 | 30 |
| | දුම්රිය දෙපාර්තමේන්තුවේ සිතියමේ නො. 06,798. ගම—හැ. 78 ද. 38 සහ හැ. 78 ද. 53½ අතරේ. | | | | |
| — | දුම්රියට ඉතුරු කරතිබේ | ගම්පොල කිරපනේ No. 45 ගෙයි පදිංචි ජයවීරමුදියන්සේලාගේ උක්කුබන්ඩා | එලවලු සහ වීගොවිතැනට | 1 0 30 | 30 |

බද්ද විකිනීමේ කොන්දේසි.

(1) එක එක බිම්කට්ටිවල සඳහන්කර තිබෙන භෝග මිස වෙනයම් කිසිදෙයක් දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය කළමනාකාරතැනගෙන් ලියවිල්ලක් පිට අවසර නොගෙන වවන්ට බැරිය.

(2) බද්ද අවුරුදු පහකටය. නමුත් මතුකී කාලයතුළ කවදා නමුත් බදුකාරයාට මාසයක් ලියවිල්ලකින් කල්දී කාලය නියමකිරීමට හෝ බද්ද අවලංගුකිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය කළමනාකාරතැනට බලය තිබේ.

(3) මෙම බද්ද මිලේට ගැනීම සඳහා තරඟයේදී ඉල්ලුම්කාරයින් විසින් ඉල්වනලද මුදල් ඔවුන් විසින් මෙම බද්දට ගෙවන්ට සතුටු අවුරුදු බද්දමෙන් පිලිගනු ලැබේ.

(4) බද්ද වැඩිම ඉල්ලුම්කාරයාට විකුනනු ලැබේ. නමුත් ඔහු විසින් ඉල්වනලද මුදල අඩුගණනේ එක එක බිම් කට්ටියට නියම්කර තිබෙන මුදල වියයුතු බව සහ ඉල්ලුම්කාරයා ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් පිලිගතයුත්තෙක්ද වියයුතුසි,

(5) පිලිගනුලැබූ බදු මුදල සම්පූර්ණයෙන්ද මිනින්දෝරු ගාස්තුවට සහ බදු ඔප්පු සෑදීමටත් රුපියල් 20ක්ද විකුණුම් දිනේදී ගැනුම්කාරයා විසින් ගෙවිය යුතුසි.

(6) අප්‍රේල් මස පළමුවෙනි දින පටන් වලන්ගුවෙන බද්දට ගෙවියයුතු බදු මුදලෙන් යම් අඩුපාඩුවක් තිබී එය ගෙවා ගැනුම්කාරයාට ඉඩම බදුගත් දිනේදීම ඉඩම අත්කර ගැනීම පුලුවන.

(7) මතු අවුරුදුවලට ගෙවියයුතු මුදල් එක එක අවුරුද්දේ අප්‍රේල් මාසේ පළමුවෙනි දිනට මත්තෙන් දුම්රිය දෙපාතිමේන්තුවේ සාමාන්‍ය කළමනාකාරතැනට ගැනුම්කාරයා විසින් ගෙවිය යුතුය. නියම දින පටන් තිස්දවසක්තුළදී එසේ ගෙවන්ට නොයෙදුනොත් දුම්රිය දෙපාතිමේන්තුවේ සාමාන්‍ය කළමනාකාරතැනට මෙම බද්ද වහාම අවලන්ගුකර දැමීමට බලය තිබේ.

(8) බදු සම්බන්ධ කොන්දේසිවල තොරතුරු දැනගැනීමට නොම්මර G. M. F. 9 (E 2 X) දරණ පෝර්මය බැලිය යුතුසි. බාරගන්නාලද ඉල්ලුම්කාරයා දුම්රිය දෙපාතිමේන්තුවේ සාමාන්‍ය කළමනාකාරතැන සමග මෙම පෝර්මය ප්‍රකාර පොරොන්දුවෙන්ට ඕනෑය.

(9) ඉඩම ගැන වැඩිදුර තොරතුරු තම තමන් විසින් මහනුවර කච්චේරියට විත් දැනගන්ට පුළුවන් බව සහ සිතියමද බලාගන්ට පුළුවන.

වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 21වෙනි
දින මහනුවර කච්චේරියේදීය.

(අත්සන්කළේ), ඩබ්ලිව් ඇල්. කින්ඩර්ස්ලි,
මධ්‍යම දිසාවේ ඒජන්ත වෙනුව.

---

No. 4,314, S. P.—දකුනු දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දිනවූ බෘහස්පතින්ද පස්වරු 1.30ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුනු දිසාවේ ගාලු පලාතේ තල්පෙපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 23ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| | මුල් සිතියම 11,944. ගම—තෙල්ලම්බුරේ. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | |
| 2 | මොරගහමුල්ලෙන්ගොඩකන්ද නොහොත් ගොනගහමුල්ලනේදූව | — | හේන | 0 | 3 | 14 |
| | මුල් සිතියම 12,666. ගම—කොව්වව. | | | | | |
| 1 | බටලන්දේගොඩකන්ද | කොව්ටොව පදිංචි කේ. කිරිගෝරිස් | සුළුබැද්ද | 1 | 3 | 14* |
| 2 | බටලන්දේගොඩදෙනිය | එම | දෙනිය | 0 | 0 | 36* |
| | මුල් සිතියම 12,727. ගම—දකුනු මලල්ගොඩපිටිය. | | | | | |
| 1 | ගල්දෙනිකන්ද නොහොත් ගල්කැටියේකැන්ද | බටදූවේ පදිංචි ඩී. ඇල්. ඇස්. ඩේවිඩ් ද සිල්වා | මහබැද්ද | 2 | 0 | 34* |
| 2 | එම | — | එම | 0 | 0 | 33* |
| 3 | එම | — | එම | 1 | 1 | 36* |
| | මුල් සිතියම 12,731. ගම—කබරගල. | | | | | |
| 1 | ඌරුඋඩුමුල්ල | කබරගල පදිංචි රණසිංහ මන්ත්‍රි නොහොත් අබියස් වනිගරත්න නොහොත් පී. ආර්. අබියස් | කුඹුර | 0 | 0 | 18 |
| 2 | එම | එම | එම | 0 | 1 | 10 |
| | මුල් සිතියම 12,821. ගම—කොව්ටොව. | | | | | |
| 1 | ගල්ගොඩදෙනියේඕකන්ද | කොව්ටොව පදිංචි පී. වී. වෙලිස්අප්පු | මහබැද්ද | 1 | 3 | 13 |
| 2 | ගල්ගොඩකැලේ | බද්දේගම පදිංචි ඒ. ජී. ජයසුන්දර | එම | 2 | 0 | 17 |
| 3 | එම | එම | සුළුබැද්ද | 1 | 2 | 3 |
| | මුල් සිතියම 12,826. | | | | | |
| 1 | උඩුමුල්ලේගොඩ නොහොත් ගොරකඔබිවේගොඩ | ගල්වඩුගොඩ පදිංචි ජී ඒ. බර්ලිස්හාමි | මහබැද්ද | 21 | 1 | 1 |
| 2 | එම | — | එම | 1 | 1 | 12† |
| 3 | එම | — | එම | 0 | 2 | 30† |
| | මුල් සිතියම 12,828. | | | | | |
| 1 | උඩුමුල්ලේගොඩකන්ද | — | එම | 6 | 0 | 17† |
| 2 | එම | උක්වත්තේ පදිංචි දොන එන්ගල්තිනා ද සිල්වා | සුළුබැද්ද | 2 | 3 | 37 |
| 3 | එම | එම | මහබැද්ද | 2 | 1 | 20 |
| 4 | එම | එම | එම | 4 | 1 | 1 |
| | අයිතිකමකියන්නා—කොපීටොව පදිංචි හේවාමානගේ අර්නෝලිස්. | | | | | |
| 5 | උඩමුල්ලේඕවිට | — | වත්ත | 0 | 0 | 13 |
| | මුල් සිතියම 12,829. ගම—ලේගම්පොල. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | |
| 1 | වේවාගොඩකතෙදෙනිය නොහොත් ගිනිගල්ගොඩැල්ලේකන්දේදෙනිය | — | දෙනිය | 0 | 1 | 20† |
| 2 | වෙව්වාගොඩකන්ද නොහොත් ගිනිගල්ගොඩැල්ලකන්ද | ගාල්ලේ මොරගලලවත්තේ පදිංචි ආර්. අමරසූරිය | මහබැද්ද | 4 | 3 | 24 |
| | මුල් සිතියම 12,830. ගම—කොම්බල. | | | | | |
| 1 | කොරමිල්ලේමැඩදූව | කොම්බල පදිංචි කේ. ඇල්. පීරිස්අප්පු | හේන | 1 | 0 | 17 |
| 2 | එම | — | එම | 1 | 0 | 12 |
| 3 | එම | — | එම | 0 | 0 | 37† |
| | මුල් සිතියම 12,839. ගම—කොටොව. | | | | | |
| 1 | ඇටමාලකන්ද | ගොඩකන්දෙ පදිංචි ජේ. ඒ. ජයවර්දන | එම | 2 | 2 | 11 |
| 2 | එම | — | එම | 0 | 0 | 23† |
| 3 | එම | බද්දේගම පදිංචි ඒ. ජී. ජයසුන්දර | එම | 0 | 3 | 31 |

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| | | මුල් සිතියම 12,841. ගම—අඟුළුගහ. | | |
| 1 | කුන්දප්පකන්ද | මාගල්ලේ පදිංචි එච්. ඇල්. වික්ටර් | හේන | 4 3 38 |
| | | මුල් සිතියම 12,861. ගම—වටවන. | | |
| 1 | හෙව්විපස්පැලේගොඩ | වටවන පදිංචි ඩබ්ලිව්. වී බස්තියන් | එම | 2 0 4 |

* මෙම ඉඩම්කැබලි මිනිරන් හැරීමේ බලයත් සමග විකුනනුලැබේ. † නගනම් ඉඩම් (විකිනීමට නොවේ).

දැන්වීමයි.—මෙම ඉඩම්වල තක්සේරුව විකුණන වේලාවේදී දන්වනුලැබේ.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ගාල්ලේ ඒජන්ත උන්නාන්සේගෙන්ද ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 22වෙනි දින කොළඹ මහලේකම්තුමාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. බී. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තුමාරිස් වර්ගය

---

**No. 4,315, S. P.**—දකුණු දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ඔක්තෝබර් මස 8වෙනි දිනවූ බ්‍රහස්පතින්ද පස්වරු 1.30ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බද්දරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ තල්පේපත්තුවේ කොඩ්ඩාසගේ පිහිටා තිබෙන බිම්කැබලි 34ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප |
|---|---|---|---|---|
| | | මුල් සිතියම 12,011. ගම—පොල්පාගොඩ. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | |
| 2 | තලකොලකුඹුරඅඳුර නොහොත් තලකොලපිට්ටනිය | — | දෙනිය | 0 1 6 |
| | | මුල් සිතියම 12,317. ගම—තෙල්ලඹුරේ. අයිතිකමකියන්නා—තෙල්ලඹුරේ පදිංචි ඒ. ජී. ජේම්ස් අප්පු. | | |
| 1 | අකුලේහේනේදෙනිය | හික්කඩුවේ පදිංචි ඇල්. ඇල්. ජේනිස්ද සිල්වා | කුඹුර | 3 3 17 |
| | | මුල් සිතියම 12,363. ගම—නැගෙනහිර උනවටුන. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | |
| 3 | කහටගහවත්ත | — | මුඩුබිම | 0 0 9 |
| | | මුල් සිතියම 12,408. ගම—තල්ගම්පල. | | |
| 3 | හැතැක්මේ කැලේ නොහොත් ඉලුක්මන්ඩියේගොඩකන්ද | ගාල්ලේ පදිංචි ඒ. සී. අබේගුනවර්ධන | හේන සහ දෙනිය | 7 0 34 |
| 5 | එම | එම | හේන | 0 2 19 |
| | | මුල් සිතියම 12,681. ගම—උඩුමලගල. | | |
| 1 | වැලිදෙනියේගොඩ | — | කැලේ | 0 0 16 |
| 2 | එම | උනවටුනේ පදිංචි ඒ බී. ගුනතිලක | එම | 9 1 1 |
| | | මුල් සිතියම 12,703. ගම—හව්පේ. | | |
| 1 | තැන්නේහේන | හව්පේ පදිංචි ජී. කරෝලිස් | හේන | 1 2 3 |
| 2 | ගල්ඇන්දෙදෙනියේගොඩ නොහොත් මහහේනේගොඩ නොහොත් ඉහලතැන්නේහේන | — | කැලේ | 4 1 31 |
| 3 | එම | — | එම | 0 0 13 |
| 4 | එම | — | එම | 0 0 31* |
| 5 | ඉහලතැන්නේහේන නොහොත් තැන්නේහේනේගොඩ | මාගාල්ලේ පදිංචි එච්. ඇල්. මැන්දිස් | එම | 4 0 29 |
| | | අයිතිකමකියන්නා—මාගාල්ලේ පදිංචි එච්. ඇල්. මැන්දිස්. | | |
| 6 | ඉහලතැන්නේහේනේවත්ත නොහොත් කැරැන්පිටිවේගොඩවතත | — | හේ වගාව | 0 3 2 |
| | | අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | |
| 7 | කැරැන්පිටිවේගොඩදෙනිය | — | දෙනිය | 0 0 21 |
| | | ගම—කහඳ. අයිතිකමකියන්නා—කහඳ පදිංචි (1) ආර්. තෙරුන්නාන්සේ, (2) කේ. ජී. ලැසිනෝ, (3) කේ. ජී. බබහාමි, (4) කේ. ජී. දොන් දියස්, (5) කේ. ජී. කතිරිනා. | | |
| 8 | කැරැන්පිටිවේගොඩවත්ත | — | වත්ත | 0 1 13 |
| | | අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | |
| 9 | තැන්නේහේන | මාගාල්ලේ පදිංචි එච්. ඇල්. වික්ටර් | කැලේ | 1 0 5 |
| | | අයිතිකමකියන්නා—මාගාල්ලේ පදිංචි එච්. ඇල්. මැන්දිස්. | | |
| 10 | කැරැන්පිටිවේගොඩවත්ත | — | හේ වගාව | 0 1 34 |
| | | මුල් සිතියම 12,735. ගම—නබදව. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | |
| 1 | ගල්ලේමුල්ල නොහොත් හන්ගවල දෙනියේගොඩ | ගාල්ලේ පදිංචි ජේ. ජී. සහබන්දු | සුළුබැද්ද | 6 0 25 |
| 2 | එම | — | එම | 0 1 0* |
| | | මුල් සිතියම 12,748. ගම—අඟුළුගහ. | | |
| 1 | කිතුල්ගහවලදෙනිය නොහොත් කනමියාගලදෙනිය | අඟුළුගහ පදිංචි එච්. කේ. පේදිරිස් | කුඹුර සහ එලිමහන් ඉඩම | 0 1 20 |
| 2 | එම | එම | වත්ත | 0 0 16 |
| | | මුල් සිතියම 12,754. | | |
| 1 | බැද්දෙකුඹුරේදූව නොහොත් මහකුඹුරේගොඩ | අඟුළුගහ පදිංචි පී. එච්. ජෝන් | හේන | 0 0 24 |
| 2 | එම | එම | එම | 0 3 20 |
| 3 | එම | එම | එම | 0 0 13* |
| | | මුල් සිතියම 12,755. ගම—තෙල්ලඹුරේ. | | |
| 1 | කියාරයාඋඩුමුල්ලේගොඩ | බෝපේ පදිංචි ජී. සී. ඩයස් | එම | 4 0 8 |
| | | මුල් සිතියම 12,772. ගම—උඩුබැත්තාව. | | |
| 1 | ගොන්සියහේන | බෝපේ පදිංචි ජී. සී. ඩයස් | එම | 0 0 27* |
| 2 | එම | ගාල්ලේ පදිංචි ජේ. ආර්. විරසේකර | එම | 8 1 30 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 3 | ගොන්සියහේන .. | — .. .. | හේන .. | | — | |
| 4 | එම .. | — .. .. | එම .. | 0 | 0 | 14 |
| | **මූල් සිතියම 12,774. ගම—තල්ගම්පල.** | | | | | |
| 1 | ඉළුක්මන්ඩියවත්තේගොඩ .. | ගාල්ලේ පදින්චි එච්. බී. ගුනවඩ්න .. | එම .. | 2 | 1 | 8 |
| 2 | එම .. | — .. .. | එම .. | 0 | 0 | 22* |
| 3 | එම .. | ගාල්ලේ පදින්චි එච්. බී. ගුනවඩ්න .. | එම .. | 0 | 3 | 22 |
| 4 | එම .. | — .. .. | එම .. | 1 | 2 | 5* |
| 5 | එම .. | ගාල්ලේ පදින්චි ජේ. එච්. ඩයස් අබේගුනවඩ්න | එම .. | 3 | 0 | 16 |
| 6 | එම .. | — .. .. | එම .. | 0 | 1 | 19* |
| | **මූල් සිතියම 12,781. ගම—උඩුබැත්තෑව.** | | | | | |
| 1 | ගල්දෙනියේගොඩකන්ද .. | මානවිල පදිංචි ඩී එච්. ඩෙන් ජේම්ස් ද සිල්වා | කැලේ .. | 9 | 3 | 12 |
| 2 | එම .. | — .. .. | කේ. ගිරිගෝරිස් විසින් වැඩිපුර අල්ලාගෙන තිබෙන ඉඩම | 0 | 2 | 4 |
| | **මූල් සිතියම 12,784. ගම—කබරගල.** | | | | | |
| 1 | අමුකොටුවේකන්ද නොහොත් අමුකොටුකන්ද | බටදූවේ පදින්චි ඩී. ඇල්. සී. අප්‍රයස් ද සිල්වා | සුළුකැලේ .. | 1 | 3 | 21 |
| 2 | අමුකොටුවේකන්දේ දෙනිය .. | එම .. .. | දෙනිය .. | 0 | 1 | 3 |
| | **මූල් සිතියම 12,796. ගම—කෝම්බල.** | | | | | |
| 1 | කන්දවත්තේගොඩකැලේ .. | — .. .. | සුළුකැලේ .. | 0 | 0 | 20 |
| 2 | කන්දවත්තේගොඩ .. | — .. .. | සුළුකැලේ සහ හේන .. | 0 | 0 | 35* |
| 3 | පොල්ගහඋඩුමුල්ලේදෙනිය නොහොත් කන්දවත්තේගොඩ | ගාල්ලේ පදින්චි ඩබ්ලිව්. අමරසිංහ .. | හේන .. | 0 | 3 | 34 |
| 4 | පොල්ගහඋඩුමුල්ලේකුඹුර නොහොත් පොල්ගහඋඩුමුල්ලේ දෙනිය | — .. .. | පී. දවිත් සහ පී. සුවාරිස් විසින් වැඩිපුර අල්ලාගෙන තිබෙන ඉඩම | 0 | 0 | 14 |

* තහනම් බිම්කට්ටි (විකුනනුනොලැබේ.)

තක්සේරු මුදල් විකිනීමේදී දන්වනුලැබේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ගාල්ලේ දකුනු පළාතේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ ප්ලෑන සර්වේයර් ජනරල් තුමාගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්‍ෂ 1925ක්වූ අගෝස්තු මස 24වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ජී. බී. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 2,446, N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සදහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1925ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දිනවූ බෘහස්පතින්ද පස්වරු 1.30ට අනුරාධපුර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කුවේ හුරුළුපලාතේ කල්පේකෝරලේ පිහිටා තිබෙන බිම් කැබලි 34ක්.

**මූල් සිතියම 6,212. ගම—මරදන්කඩවල. අයිතිකමකියන්නා—ආණ්ඩුව.**

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කිරියගහඉඩම .. | කේ. කන්දගේ .. | වියට සුදුසු ඉඩම .. | 1 | 3 | 11 | 30 |
| | **මූල් සිතියම 6,659. ගම—ඇටවිරවැව (පාලු) කටුවේරගලෑව.** | | | | | | |
| 1 | මීගහඉඩම .. | ඩිංගිරියා වෙල්පතික්කියා සහ තව පස්දෙනෙක් | වියට සුදුසු ලඳුකැලේ .. | 6 | 0 | 3 | 20 |
| 2 | එම .. | — .. .. | ලඳුකැලේ, පින්පාර දිගේ ඉතිරි කරපු හරිය | 0 | 0 | 20 | —* |
| | **මූල් සිතියම 6,917. ගම—හම්මිල්ලෑව (රදු).** | | | | | | |
| 1 | දිවුල්ගහඉඩම .. | කේ. කදිරා හේනයා .. | කැලේ .. .. | 2 | 1 | 6 | 30 |
| 2 | එම .. | — .. .. | පිට්ටනි මුඩුබිම, පාර දිගට ඉතිරි කරපු හරිය | 0 | 0 | 15 | —* |
| | **මූල් සිතියම 6,919. ගම—මරදන්කඩවල.** | | | | | | |
| 1 | ඇහැටුගහඉඩම .. | පී. බණ්ඩාරල සහ කේ. උක්කුබංඩා | කැලේ .. .. | 1 | 1 | 11 | 40 |
| 2 | පලුගහකුඹුර .. | — .. .. | ඇස්. සෙන්නිඑතනා විසින් ඉල්ලුම්කර තිබෙන කුඹුර | 0 | 1 | 1 | 20 |
| | **මූල් සිතියම 6,966. ගම—ඔලුගස්කඩ.** | | | | | | |
| 1 | වීරගහඉඩම .. | පු. සිලම්බුරාල .. | කැලේ .. .. | 3 | 1 | 5 | 23 |
| 2 | මීගහඉඩම .. | එම .. .. | එම .. .. | 1 | 0 | 6 | 46 |
| | **මූල් සිතියම 6,989. ගම—පහල එලිකිඹුලාගල.** | | | | | | |
| 1 | දඹගහඉඩම .. | ඇස්. සුලෙසිමාන් .. | පඳුරු කැලේ .. .. | 0 | 3 | 33 | 20 |
| | **මූල් සිතියම 4,055. ගම—පාලිප්පොතාන.** | | | | | | |
| 1074 | මයිලගහලන්දඉඩම .. | සී. ඇම්. පුංචිරාල කෝරාල, ඊතල් වැටුනු වැව | වත්තකට සුදුසු ලඳුකැලේ .. | 0 | 2 | 8 | 20 |
| | **මූල් සිතියම 6,363. ගම—රත්මලගහවැවගම.** | | | | | | |
| 1 | මයිලගහඉඩම .. | පී. මැනික්රාල .. | වියට සුදුසු පඳුර .. | 0 | 3 | 37 | 20 |
| | **මූල් සිතියම 6,439. ගම—දිවුල්වැව.** | | | | | | |
| 1 | එම .. | පු. පුන්චිරාල සහ තවත් අය .. | වියට සුදුසු කැලේ .. | 6 | 0 | 14 | 21 |
| 2 | එම .. | — .. .. | පිට්ටනි ඉඩම, පාර දිගේ ඉතිරි කරපු බිම | 0 | 0 | 18 | —* |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | | මුල් සිතියම 6,853. ගම—ගෝනුමැරියාව. | | | | | |
| 1 | මසිලගහඉඩම | ඇස්. ලපයා විදානෙපේඩියා | තිස්බංඩි, කැලේ සහ මුඩුබිම | 0 | 2 | 13 | 25 |
| 2 | එම | — | කැලේ, වැකන්ඩිය දිගේ ඉතිරි කරපු හරිය | 0 | 0 | 22 | —* |
| 3 | එම | — | පාර සහ පිට්වනි ඉඩම අඩි පාරට ඉතිරිකරපු හරිය | 0 | 0 | 17 | —* |
| | | මුල් සිතියම 6,855. ගම—පලුකෙටුවැව. | | | | | |
| 1 | කදුරුගහඉඩම හෙවත් බෝගහඉඩම හෙවත් මසිලගහඉඩම | යු. නයිදුරල වී. වී. | කැලේ | 2 | 1 | 14 | 20 |
| 2 | එම | — | කැලේ, කරත්ත පාර දිගේ ඉතිරි කරපු හරිය | 0 | 0 | 10 | —* |
| | | මුල් සිතියම 6,856. ගම—පලුකෙටුවැව. | | | | | |
| 1 | මසිලගහඉඩම | රස්නකවැවේ පදිංචි කේ. වනනකු රල සහ තවත් අයෙක් | කැලේ සහ හේන | 6 | 2 | 14 | 24 |
| | | මුල් සිතියම 6,881. ගම—රස්නකවැව. | | | | | |
| 1 | එම | රස්නකවැවේ පදිංචි යු. කදිරගේ | පදුරු කැලේ | 2 | 0 | 27 | 20 |
| 2 | මසිලගහකැලේ | — | පදුරු කැලේ, වාන් ඇල දිගේ ඉතිරිකරපු හරිය | 0 | 2 | 2 | —* |
| | | මුල් සිතියම 6,912. ගම—ඇතා වැටුනු වැව. | | | | | |
| 1 | මසිලගහඉඩම | බඩහැල ඇතාවැටුනුවැවේ පදිංචි කේ. නයිදු | ලඳුකැලේ | 1 | 3 | 28 | 20 |
| 2 | එම | — | පිට්වනි මුඩුබිම, අතුපාර දිගේ ඉතිරි හරිය | 0 | 0 | 24 | —* |
| | | මුල් සිතියම 6,928. ගම—උල්පතගම. | | | | | |
| 1 | එම | රස්නකවැවේ පදිංචි පී වන්නිහාමි | පදුරු කැලේ | 8 | 2 | 7 | 20 |
| | | මුල් සිතියම 6,929. ගම—රස්නකවැව. | | | | | |
| 1 | එම | යු. කදුරල මල්කම | පදුරු කැලේ | 3 | 3 | 1 | 20 |
| | | මුල් සිතියම 6,930. | | | | | |
| 1 | එම | කේ. මැනික්රල වී. වී. | පදුරු කැලේ | 2 | 0 | 0 | 20 |
| | | මුල් සිතියම 6,945. ගම—වලහවිද්දවැව. | | | | | |
| 1 | එම | — | පදුරු කැලේ, වෙල් ඇල දිගේ ඉතිරිකරපු හරිය | 0 | 0 | 13 | —* |
| 2 | එම | ඇම්. මල්හාමි වෙ. වි. | පදුරු කැලේ | 1 | 0 | 3 | 20 |
| | | මුල් සිතියම 6,946. | | | | | |
| 1 | මීගහඉඩම | කේ. අප්පුහාමි | පදුරු කැලේ | 5 | 0 | 26 | 22 |
| 2 | එම | — | පදුරු කැලේ, වෙල් ඇල දිගේ ඉතිරිකරපු හරිය | 0 | 0 | 24 | —* |
| | | මුල් සිතියම 6,968. ගම—මහකුඹුක්වැව. | | | | | |
| 1 | කෝන්ගහඉඩම | යු. බද්දේරල | ලඳුකැලේ | 1 | 1 | 9 | 20 |
| | | මුල් සිතියම 6,969. ගම—පලුකෙටුවැව. | | | | | |
| 1 | කදුරුගහඉඩම හෙවත් කෝන්ගහඉඩම | ඇම්. සෙල්ලාගේ | පදුරු කැලේ | 1 | 3 | 24 | 20 |
| | | මුල් සිතියම 6,970. | | | | | |
| 1 | එම | ඇන්. කන්දගේ | පදුරු කැලේ | 1 | 3 | 27 | 22·50 |

* විකිනීමට නොවේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ උතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 21වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. බී. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 2,447, N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සදහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ඔක්තෝබර් මස විසිදෙවෙනි දිනවූ බෘහස්පතින්ද පස්වරු 2ට කැබිතිගොල්ලෑවේ ප්‍රසිඩ වැඩදෙපාර්තමේන්තුවේ බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට නියෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කේ හුරුළු පලාතේ පිහිටා තිබෙන බිම්කැබලි 43ක්.

මුල් සිතියමේ නො. 6,658. ගම—කුන්චුට්ටුකෝරලේ කුඹුක්වැතුලාගේ හැන්දුගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු |
|---|---|---|---|---|---|---|---|
| 1 | දඹගහඉඩම | රත්මලවැටියේ පදිංචි පුන්චිඅප්පුගේ වන්නිහාමි සහ තවත් අය | සනකැලෑව සහ ලඳුකැලේ | 2 | 0 | 9 | 26 |
| 2 | එම | — | පිට්වනිබිම, පිංපාරදිගේ ඉතිරිකරපු හරිය | 0 | 0 | 7 | —* |
| | | මුල් සිතියමේ නො. 6,884. ගම—කුන්චුට්ටුකෝරලේ කුඹුක්වැතුලාගේ වත්තේවැව. | | | | | |
| 1 | එම | — | කැලේ සහ මූකලාන වාන්ඇල දිගේ ඉතිරිකරපුහරිය | 0 | 1 | 8 | —* |
| 2 | එම | වතෙතවැවපදිංචි ඩබ්ලිව්. ඇම්. විජේරතන | කැලේ | 2 | 0 | 21 | 20 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | | මුල් සිතියමේ නො. 6,891. ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ හැන්දුගම. | | | | | |
| 1 | දඹගහඉඩම .. | ගෝනුබැද්දෙන්නැව පදිංචි උක්කුරාල ගේ සිලම්බුරාල | හේන .. .. | 2 | 0 | 21 | 20 |
| | | මුල් සිතියමේ නො. 6,897. ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ උඩන්ගාව. | | | | | |
| 1 | මසිලගහ ඉඩම | කිරිමැටියාවේ පදිංචි කව්රාල ගමරාලගේ නාසිදුරාල | කැලේ .. .. | 2 | 2 | 36 | 20 |
| | | මුල් සිතියමේ නො. 6,900 ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ දමුනුගොල්ලැව (පාලු) රැලපනාව. | | | | | |
| 1 | බෝගහ ඉඩම | රැලපනාවේ පදිංචි කපුවා මුහන්දිරම්ගේ සිමන් නායිදේ | කැලේ .. .. | 1 | 2 | 12 | 20 |
| 2 | එම .. | — .. .. | එම වැකන්ද දිගේ ඉතිරිකරපු හරිය | 0 | 2 | 0 | —* |
| | | මුල් සිතියමේ නො. 6,901. ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ රැලපනාව. | | | | | |
| 1 | ගොඩකිරලගහ ඉඩම | රැලපනාවේ පදිංචි කපුවාමුහන්දිරම්ගේ පුංචිනායිදේ | එලිකරපු හේන .. .. | 0 | 2 | 5 | 25 |
| 2 | කෝංගහවත්ත | — .. .. | රැලපනාවේ පදිංචි පිකිරිඅප්පු වෙල් විදානේ විසින් ඉල්ලාසිටින අවුරුදු 2ක්වූ දෙහිගස් දෙකක්ද, අවුරුදු 3ක්වූ පොල්ගසක්ද සහිත වත්ත | 0 | 2 | 1 | 24 |
| | | මුල් සිතියමේ නො. 6,903. ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ කැබිතිගොල්ලැව. | | | | | |
| 1 | දඹගහඉඩම .. | කැබිතිගොල්ලැවේ පදිංචි බී. ඇම්. යූ. සිරිවඩීන | වීගොවිතැනට සුදුසු සනකැලැව .. | 2 | 1 | 26 | 20 |
| 2 | එම .. | — .. .. | එම, වැකන්ද දිගේ ඉතිරිකරපු හරිය | 0 | 2 | 29 | —* |
| 3 | එම .. | — .. .. | එම පාර දිගේ ඉතිරිකරපු හරිය .. | 0 | 0 | 37 | —* |
| | | මුල් සිතියමේ නො. 6,904 | | | | | |
| 1 | පලුගහඉඩම .. | කැබිතිගොල්ලැවේ පදිංචි කදිරාතෙගේ අප්පුරාල | වීගොවිතැනට සුදුසු හේන .. | 2 | 0 | 1 | 23 |
| 2 | එම .. | — .. .. | හේන සහ කැලේ, හැන්දුඹය දිගේ ඉතිරිකරපු හරිය | 0 | 1 | 21 | —* |
| | | මුල් සිතියමේ නො. 6,905. | | | | | |
| 1 | දඹගහඉඩම .. | කැබිතිගොල්ලැවේ පදිංචි සී. ආර්. මල් හාමි ලේකම | වීගොවිතැනට සුදුසු ලඳුකැලේ .. | 2 | 3 | 39 | 20 |
| 2 | එම .. | — .. .. | එම, පාරදිගේ ඉතිරිකරපු හරිය .. | 0 | 0 | 20 | —* |
| | | මුල් සිතියමේ නො. 6,906. | | | | | |
| 1 | මසිලගහ ඉඩම | කැබිතිගොල්ලැවේ පදිංචි අඹරාතෙගේ පුංචිරාල | වීගොවිතැනට සුදුසු ලඳු කැලේ .. | 1 | 3 | 27 | 20 |
| | | මුල් සිතියමේ නො. 6,908. ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ ගෝනුහද්දෙනැව. | | | | | |
| 1 | මීගහඉඩම .. | ගෝනුහද්දෙනැවේ පදිංචි අප්පුරාලගේ මැණික්රාල | කැලේ .. .. | 0 | 3 | 28 | 24 |
| | | මුල් සිතියමේ නො. 6,913. | | | | | |
| 1 | මසිලගහ ඉඩම | ගෝනුහද්දෙනැවේ පදිංචි කේ ඇක්ස්. වෙල්විදානෙගේ මැණික්රාල | කැලේ .. .. | 5 | 3 | 2 | 20 |
| 2 | කදුරුගහ ඉඩම | ගෝනුහද්දෙනැවේ පදිංචි උක්කුරාලගේ සිලම්බුරාල | එම .. .. | 5 | 2 | 18 | 20 |
| 3 | එම .. | — .. .. | එම, පින්පාර දිගේ ඉතිරිකරපු හරිය | 0 | 0 | 33 | —* |
| | | මුල් සිතියමේ නො. 6,914. ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ පුලියන්කුලම. | | | | | |
| 1 | දඹගහඉඩම .. | පුලියන්කුලමේ පදිංචි උක්කු රාලගේ කපුරාල | කැලේ .. .. | 2 | 0 | 9 | 20 |
| 2 | එම .. | — .. .. | කැලේ, අඩිපාරදිගේ ඉතිරිකරපුහරිය | 0 | 0 | 20 | —* |
| | | මුල් සිතියමේ නො. 6,923. ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ උඩන්ගාව. | | | | | |
| 1 | මසිලගහ ඉඩම | උඩංගාවේ පදිංචි අප්පුරාලගේ උක්කුරාල | කැලේ .. .. | 1 | 0 | 37 | 20 |
| 2 | එම .. | — .. .. | එම සහ උස්බිම .. .. | 0 | 0 | 25 | 20 |
| 3 | එම .. | — .. .. | කැලේ, කරත්තපාරදිගේ ඉතිරිකරපු හරිය | 0 | 0 | 21 | —* |
| | | මුල් සිතියමේ නො. 6,927. ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ වත්තේවැව. | | | | | |
| 1 | දඹගහඉඩම .. | වත්තේවැව පදිංචි නාසිදුරාලගේ සෙල්ල වත්තිහාමි | ලඳුකැලේ .. .. | 1 | 0 | 19 | 20 |
| | | මුල් සිතියමේ නො. 6,937. ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ අප්පුවැව. | | | | | |
| 1 | මසිලගහ ඉඩම | — .. .. | කැලේ .. .. | 1 | 0 | 33 | 20 |
| 2 | එම .. | අප්පුවැවේ පදිංචි උකකුරාලගේවත්තිහාමි | හේන .. .. | 1 | 0 | 9 | 20 |
| | | මුල් සිතියමේ නො 6,939. ගම—ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ (පාලු) කුඩාකම නිකවැව. | | | | | |
| 1 | මසිලගහ ඉඩම | නිකවැවේ පදිංචි නායිදගේ උක්කුවා .. | ලඳුකැලේ .. .. | 0 | 3 | 24 | 20 |
| 2 | අක්කරඉඩම .. | — .. .. | නිකවැවේ කපුවාගේ නායිද විසින් ඉල්ලාසිටින කුඹුර | 0 | 1 | 23 | 22·50 |
| | | මුල් සිතියමේ නො 6,949. ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ (පාලු) කොහොඹගස්වැව කෝලිබැන්දුව. | | | | | |
| 1 | දඹගහඉඩම .. | කෝලිබැන්දුවේ පදිංචි කපුරාලගේ සිලම්බු රාල | කැලේ .. .. | 2 | 0 | 27 | 20 |
| | | මුල් සිතියමේ නො 6,987. ගම—කුත්වුට්ටුකෝරලේ කුඹුක්වැතුලානේ වත්තේවැව. | | | | | |
| 1 | බෝගහඉඩම .. | වත්තේවැව පදිංචි උක්කුරාල ගමරාලගේ කිරිබංඩා සහ තව අයෙක් | කැලේ .. .. | 0 | 3 | 36 | 20 |
| 2 | එම .. | එම .. .. | එම .. | 2 | 0 | 14 | 20 |
| 3 | එම .. | — .. .. | එම, ඇලදිගේ ඉතිරිකරපු හරිය .. | 0 | 0 | 31 | —* |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | | මුල් සිතියමේ නො. 6,988. | | | | | |
| 1 | දිවුල්ගහ ඉඩම | — .. .. | කැලේ, අඩිපාරදිගේ ඉහිරිකරපුහරිය යනාදිය | 0 | 0 | 35 | —* |
| 2 | එම .. | වත්තේවැව පදිංචි කන්දතේ අප්පුරාල | කැලේ .. .. | 1 | 1 | 6 | 20 |
| | | මුල් සිතියමේ නො. 6,898. ගම—කුන්චුට්ටුකෝරළේ කුඹුක්වැතුලානේ කිරිමැටියාව. | | | | | |
| 1 | මසිලගහ ඉඩම | කිරිමැටියාවේ පදිංචි කපුරාලගේ පුත් අප්පුරාල | කැලේ .. .. | 1 | 0 | 2 | 22 |
| 2 | එම .. | — .. .. | එම, කරත්තපාර දිගේ ඉතුරුකරපු හරිය | 0 | 0 | 16 | —* |
| 3 | උඩවත්ත .. | — .. .. | අවුරුදු 3ක් පමණ වෙන පොල්පැලද, 12ක් පමණ වෙන කොස්ගස්ද සහිත වත්ත සහ කොඩනගාගත්ත ගෙයක්, කිරිමැටියාවේ පදිංචි කදිරවේලාතේගමරාලගේ බද්දෙරාල මොහොට්ටාල විසින් ඉල්ලාතිබේ. | 0 | 0 | 37 | 26 |
| 4 | එම .. | — .. .. | කිරිමැටියාවේ පදිංචි කදිරවේලාතේ ගමරාලගේ බද්දෙරාල මොහොට්ටාල විසින් ඉල්ලාතිබෙන අවුරුදු 3 පමණ වෙන පොල්පැල 10ක්ද, කෙසෙල් ගස් 16ද සහිත ඉඩම සහ වැකන්දදිගේ ඉහිරිකරපු කොටස | 0 | 0 | 15 | —* |
| 5 | එම .. | — .. .. | පිට්ටනි මුඩුබිම, වැකන්දදිගේ ඉහිරිකරපු කොටස | 0 | 0 | 16 | —* |

* විකිණීමට නොවේ.

මෙම ඉඩම් සම්බන්ධව වැඩිදුර කාරණා උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්‍ෂ 1925ක්වූ අගෝස්තු මස 24වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඊ. බී. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහලේකම් වෙනුවට

---

**No. 2,448, N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1925ක්වූ ඔක්තෝබර් මස 13වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1·30ට අනුරාධපුර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කේ නුවරගම්පලාතේ පිහිටා තිබෙන බිම්කැබලි 23ක්

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | | මුල් සිතියම I. S. P. P. No. 3. ගම—නුවරගම්කෝරළේ කළුආරච්චියාගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | |
| 255 | කළුආරච්චියාගම මූකලාන සහ කළුආරච්චියාගමහේන | — .. .. | කැලේ සහ හේන .. | 2 | 1 | 10 | 30 |
| 255A | කළුආරච්චියාගම මූකලාන සහ කළුආරච්චියාගමහේන නොහොත් පළුගහවත්ත නොහොත් පහලවැවකැලේ | කටුගම්පොලගම පදිංචි බදෙදුරාලගේ මුදලි හාමි හිටපු වෙල් විදානේ | හේන, මඩ පැලක් සහිතයි | 1 | 2 | 14 | 39 |
| 255B | කළුආරච්චියාගමහේන .. | කළුආරච්චියාගම පදිංචි කේ. ගොම්බා වෙදා | හේන .. | 2 | 0 | 10 | 30 |
| 255D | පහලවැවකැලේ .. | කටුගම්පොලගම පදිංචි බද්දේරාලගේ මුදලි හාමි හිටපු වෙල් විදානේ | ලඳුකැලේ .. | 1 | 0 | 38 | 61 |
| | | ගම—නුවරගම්කෝරළේ හිඳෙගුගම. | | | | | |
| 150A | හිඳෙගුගමමූකලාන .. | හිඳෙගුගම පදිංචි වෙල් දේවයා .. | කැලේ .. | 22 | 3 | 13 | 33 |
| | | ගම—නුවරගම්කෝරළේ දිවුල්වැව. | | | | | |
| 230 | දිවුල්වැවමූකලාන .. | — .. .. | මූකලාන .. | 3 | 2 | 27 | 34 |
| 230A | දිවුල්වැවමූකලාන නොහොත් සියඹලාගහවත්ත නොහොත් දිවුල්වැවකැලේ | දිවුල්වැවේ පදිංචි තෙන්නකෝන් බන්ඩා හිටපු වීදියේ ආරච්චි | මඩ පැලක් සහිත හේන | 1 | 0 | 33 | 55 |
| | | ගම—නුවරගම්කෝරළේ හිංඳෙගුගම | | | | | |
| 195H | හිඳෙගුගමමූකලාන .. | දිවුල්වැවේ පදිංචි ජුවානිස් .. | මූකලාන, අවුරුදු 3ක් පමණ පොල් ගස් සහිතයි | 0 | 1 | 28 | 30 |
| 147F | එම .. | එම .. .. | මූකලාන සහ අවුරුදු 3ක පමණ වෙන පොල් පැල සහිතයි | 0 | 3 | 18 | 30 |
| 196D | එම .. | දිවුල්වැවේ පදිංචි කුරුප්පු ආරච්චිගේ බුම්පි සිඤ්ඤෝ | ගම්මුන්නේවත්ත .. | 0 | 2 | 2 | 30 |
| 19[illegible]G | එම .. | එමගම පදිංචි පොන්සේකා සුවාරිස් .. | මූකලාන .. | 0 | 1 | 21 | 30 |
| 196F | එම .. | එමගම පදිංචි මැදගොඩගේ රපියෙල් පෙරේරා | එම .. | 0 | 1 | 31 | 30 |
| 196E | එම .. | එමගම පදිංචි කනාහැරආරච්චිගේ දෙන් පීරිස් කරුණාරත්න | හේන .. | 0 | 1 | 39 | 30 |
| 147B | එම .. | එමගම පදිංචි කුරුප්පු ආරච්චිගේ බුම්පි සිඤ්ඤෝ | මූකලාන .. | 0 | 1 | 30 | 30 |
| 149F | එම .. | එමගම පදිංචි ජුවානිස් .. .. | එම .. | 0 | 1 | 37 | 31·50 |
| 192A | එම .. | එම .. .. | හේන .. | 0 | 0 | 12 | 31·50 |
| 147E | එම .. | එමගම පදිංචි පොන්සේකා සුවාරිස්අප්පු .. | මූකලාන .. | 0 | 1 | 28 | 31·50 |
| 149E | එම .. | එම .. .. | එම .. | 0 | 0 | 34 | 31·50 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 147D | හිඳෙදුගමමූකලාන | දිවුල්වැවේ පදිංචි මැදගොඩගේ රපියෙල්පෙරුරා | මූකලාන | 0 | 1 | 30 | 31·50 |
| 149D | එම | එම | එම | 0 | 0 | 24 | 31·50 |
| 147C | එම | කහහැර ආරච්චිගේ දෙන් පීරිස් කරුනාරත්න | එම | 0 | 1 | 32 | 31·50 |
| 149C | එම | එම | එම | 0 | 0 | 15 | 31·50 |
| 149B | එම | දිවුල්වැව පදිංචි කුරුප්පුආරච්චිගේ බුම්පි සිඤ්ඤෝ | එම | 0 | 0 | 5 | 31·50 |

ඉහත සඳහන්වූ ඉඩම් සියල්ලක්ම නාච්චාදූව යටතේ වතුර ගතහැක. මෙච්චාට අවුරුද්දකට රුපියල් 4ර ගනනේ අක්කරයකට දියබද්ද ගෙවිය යුතුය. එය විටින්විට වෙනස්කිරීමට යටත්ය.

මෙම ඉඩම් ගැන වැඩිපුර කාරණ උතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්‍ෂ 1925ක්වූ අගෝස්තු මස 26වෙනි දින කොළඹ මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඊ. බී. ඇලෙක්සැන්ඩර්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වෙනුවට

**No. 1,544, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1925ක්වූ ඔක්තෝබර් මස 14වෙනි දිනවූ බදාදා පස්වරු 1.45ට බදුළු කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කයේ උඩුකිඳ, යටිකිඳ බුත්තල කොට්ඨාසවල පිහිටා තිබෙන බිම්කැබලි 33ක්.

අන්තිම ගම් සිතියම 106. ගම—උඩුකිඳපලාත දෙහිවිනිපලාතකෝරලේ පහම්බුරුතොට. අයිතිකම කියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 3A | උඩුතුපේහේන | — | හේන, ඇලට ඉතුරුකර තිබේ | 0 | 0 | 16 | —* |
| 3B | එම | ඩබ්ලිව්. ඇම්. හුදුබන්ඩා | හේන | 0 | 2 | 5 | 75 |
| 3C | එම | — | එම ඇලට ඉතුරුකර තිබේ | 0 | 0 | 6 | —* |
| 3D | එම | — | හේන. ගන්සබාව පාරට ඉතුරුකර තිබේ | 0 | 0 | 31 | —* |
| 3E | එම | ඩබ්ලිව්. ඇම්. හුදුබන්ඩා | හේන | 0 | 1 | 7 | 75 |
| 3F | එම | — | එම ඇලට ඉතුරුකර තිබේ | 0 | 0 | 8 | —† |
| | අන්තිම ගම් සිතියම නො. 49. ගම—උඩුකිඳපලාත දෙහිවිනිපලාතකෝරලේ පරේතොට. | | | | | | |
| 1S | දඹකොටෙහේන | ඇස්. වී. ප්‍රනාන්දු සහ ආර්. ඇම්. පුංචිරල | හේන | 3 | 1 | 3 | 94 |
| 1T | දඹකොටේපතන | එම | පතන | 1 | 0 | 34 | 94 |
| 1Y | එම | ඩබ්ලිව්. ඩබ්ලිව්. ඇම්. සිරිබද්දන | එම | 1 | 3 | 25 | 75 |
| 1Z | එම | — | පතන, ගන්සබාපාරට ඉතුරුකර තිබේ | 0 | 0 | 20 | —* |
| 1AD | රත්අඹගහඅගල | — | බැද්ද, ඉතුරුකර තිබේ | 2 | 1 | 2 | —* |
| | මූල් සිතියම 2,382. ගම—උඩුකිඳපලාත ගම්පහකෝරලේ මැදිපොකුන. | | | | | | |
| 1 | ජයසින්අරව | ජේ. පුන්චිරල | හේන | 2 | 1 | 15 | 50 |
| | මූල් සිතියම 2 453. ගම—උඩුකිඳපලාත මැදපලාතකෝරලේ උනපාන. | | | | | | |
| 1 | අම්පිටියගොඩඇලපොතත | — | පතන, කඳුරට ඉතුරුකර තිබේ | 0 | 1 | 8 | —* |
| 2 | එම | ඇන්. ඇම්. කිරිබන්ඩා | පතන | 0 | 2 | 9 | 75 |
| 3 | එම | එම | එම | 0 | 1 | 25 | 75 |
| 4 | එම | එම | පතන ගන්සබාවපාරට ඉතුරුකර තිබේ | 0 | 0 | 19 | —* |
| 5 | ගල්පච්චියේවත්ත දරන්ද පතන | ඇම්. පුංචිරල | පතන | 2 | 0 | 20 | 75 |
| 6 | තික්කලේපිත්න | බී. ඇල්. ගුනවර්‍ධන | එම | 2 | 1 | 25 | 75 |
| 7 | එම | — | පතන, කඳුරට ඉතුරුකර තිබේ | 0 | 1 | 20 | —* |
| | මූල් සිතියම 2,455. ගම—උඩුකිඳපලාත මහපලාතකෝරලේ හපුතලේගම. | | | | | | |
| 1 | දික්අරාවේපතන | බී. ඇම්. අප්පුහාමි | පතන | 2 | 3 | 26 | 125 |
| 2 | දික්අරාවේදෙනිය | — | දෙනිය සහ උල්පොත ඉතුරුකර තිබේ | 1 | 3 | 9 | —* |
| | අන්තිම ගම් සිතියම 93. ගම—යටිකිඳ පලාත බෝගොඩකෝරලේ කැවවෙල. | | | | | | |
| 19Y | කොඩෙලන්දේහේන | — | හේන, සුලුපාරට ඉතුරුකර තිබේ | 0 | 2 | 36 | —* |
| 19Z | එම | සී. ජේ හැරිමහතා | හේන | 5 | 3 | 33 | 75 |
| 19AA | එම | — | එම කඳුරට ඉතුරුකර තිබේ | 4 | 0 | 30 | —* |
| 19AB | ඉදිපතුගොඩපතන | — | පතන කොඩිගහට ඉතුරුකර තිබේ | 0 | 0 | 0 | —* |
| 19AC | ඉලිපතුගොඩකන්ද නොහොත් ඉලිපතුගොඩපතන | සී. ජේ. හැරිමහතා | පතන | 13 | 0 | 5 | 75 |
| 19AD | කොඩෙලන්දේහේන | එම | හේන | 4 | 1 | 12 | 75 |
| | අන්තිම ගම් සිතියම 32. ගම—උඩුකිඳපලාත දෙහිවිනිපලාතකෝරලේ කටුගහ. | | | | | | |
| 13K | ගල්මැදිගොඩපතන | — | පතන, ගන්සබාවපාරට ඉතුරුකර තිබේ | 0 | 0 | 7 | —* |
| 13L | එම | කොලොඅවෙල් කංකානි | පතන | 1 | 0 | 6 | 75 |
| | මූල් සිතියම 2,194. ගම—බුත්තලපලාත බුත්තලකෝරලේ උඩගම. | | | | | | |
| 7 | ලැසිමෙකනත්ත | විරපුල්ලේහේනයා | හේන | 1 | 3 | 38 | 30 |
| | මූල් සිතියම 2,386. ගම—යටිකිඳපලාත පච්චිපොලකෝරලේ අරවාකුඹුර. | | | | | | |
| 4 | ලුහුගලතලාව | — | බැද්ද සහ පතන කඳුරට ඉතුරුකර තිබේ | 2 | 2 | 31 | —* |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 6 | ලුනුගලතලාව .. | — | .. පතන, සුලුපාරට ඉතුරුකර තිබේ.. | 0 | 3 | 12 | —* |
| 7 | එම .. | — | .. පතන, කොඩිගහට ඉතුරුකරතිබේ | 0 | 0 | 30 | —* |

* විකුනන්ට නොව (නොවිකුණ ඉතුරුකිරීමට).

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරනා ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1925ක්වූ අගෝස්තු මස 24වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඊ. බී. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තාරිස් වෙනුවට.

---

**No. 1,545, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සදහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1925ක්වූ ඔක්තෝබර් මස 19වෙනි දිනවූ සඳුදා පස්වරු 1.45ට බදුළු කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ බුත්තල කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

මුල් සිතියමේ නො. 2,424. ගම—බුත්තල පලාතේ බුත්තලකෝරළේ ඔක්කම්පිටිය.

